# ලාභ අරමුණු කර නොගත් සංවිධාන

## 11 ශ්‍රේණිය

**06 පරිච්ඡේදය**

# හැඳින්වීම

- ව්‍යාපාර සංවිධාන විවිධ ආකාරයට සංවිධානය වී ඇති අතර ඒවායේ විවිධ ස්වරූප අනුව පහත ආකාරයට වර්ග කර දක්වනු ලැබේ

  - හිමිකාරිත්වය අනුව
  - අරමුණ අනුව
  - පරිමාණය අනුව

අප මෙම පාඩමේ දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කර දැක්වීම යටතේ ඇති ලාභ අරමුණු කර නොගත් සංවිධාන පිළිබඳවයි

# අරමුණු අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම

- ව්‍යාපාර සංවිධාන
  - ලාභ අරමුණු කර නොගත් සංවිධාන
    - පොදු
    - පෞද්ගලික
      - සමිති සංවිධාන
  - ලාභ අරමුණු කර ගත් සංවිධාන
    - පොදු
    - පෞද්ගලික

# ලාභ අරමුණු කර නොගත් සංවිධාන

- බොහෝ ව්‍යාපාරවල අරමුණ ලාභය ඉපයීම වුවත් සාමාජික සුභසාධනය හා සමාජ සුභසාධනය අරමුණු කරගත් ව්‍යාපාර සංවිධාන ද දක්නට ලැබේ

- එසේ ලාභය අරමුණු කර නොගත් සාමාජික සුභසාධනය හා සමාජ සුභසාධනය අරමුණු කරගත් ව්‍යාපාර සංවිධාන ලාභ අරමුණු කර නොගත් සංවිධාන ලෙස හදුන්වයි

  උදාහරණ

  - ✓ ක්‍රීඩා සමිති
  - ✓ ගොවි සමිති
  - ✓ අවමංගල්‍යාධාර සමිති
  - ✓ යෞවන සමාජ
  - ✓ කාන්තා සමිති
  - ✓ වාණිජ සමිති

# ලාභ අරමුණු කර නොගත් සංවිධාන

- ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ක්‍රියාකාරකම්
    - ප්‍රජා සේවා
    - ස්වාභාවික විපත් ආධාර
    - ශිෂ්‍යාධාර
    - ශිෂ්‍යත්ව වැනි ක්‍රියාකාරකම් මගින් තම අරමුණු මුදුන් පමුණුවා ගැනීමට කටයුතු කරයි

## ක්‍රියාකාරකම 01

*ක්‍රියාකාරකම 01*

*ඔබ ජීවත් වන ප්‍රදේශයේ දක්නට ලැබෙන ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ලැයිස්තුවක් සකස් කර එම සමිතිවල මූලික අරමුණු දක්වන්න*

## ලාභ අරමුණු කර නොගත් සංවිධානවල මූල්‍ය ක්‍රියාකාරකම්

- සංවිධානවල එදිනෙදා කටයුතු පවත්වාගෙන යාම සදහා මෙම සංවිධානවලට ප්‍රමානවත් ආදායමක් තිබිය යුතුය එමෙන්ම සංවිධානයේ වැඩ කටයුතු පවත්වාගෙන යාමේ දි විවිධ වියදම් ද දැරීමට ද සිදුවේ

නිදසුන්

| **ආදායම්** | **වියදම්** |
| --- | --- |
| සාමාජික ගාස්තු | විදුලිය / ජලය |
| කොඩි විකිණීම | දුරකථන බිල් |
| පරිත්‍යාග | පරිත්‍යාග |
| සංදර්ශන / උත්සව පැවැත්වීම | සංදර්ශන වියදම් |
| ආපනශාලා පවත්වාගෙන යාම | වැටුප් |
| තරග සංවිධානය | ලිපිද්‍රව්‍ය |

# ලාභ අරමුණු කර නොගත් සංවිධාන මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුත්තේ ඇයි ?

1* සංවිධාන කටයුතු විනිවිදභාවයකින් කරගෙන යාමට

2* සංවිධානය පිළිබඳ ඇල්මැති පාර්ශව දැනුවත් කිරීම

3* සාමාජිකයනගේ විශ්වාසය දිනා ගැනීම

4* සංවිධානයේ ඉදිරි කටයුතු සැලසුම් කිරීමට

5* සංවිධාන කටයුතු ක්‍රමවත්ව පවත්වා ගෙන යාමට

ඉහත හේතූන් මත ලාභ අරමුණු කර නොගත් සංවිධාන ද පහත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි

1 ලැබීම් හා ගෙවීම් ගිණුම

2 ආදායම් වියදම් ගිණුම

# ලැබීම් හා ගෙවීම් ගිණුම

- ලාභ අරමුණු කර නොගත් සංවිධානවල කිසියම් කාලපරිච්ඡේදයක් සිදුවන සියලුම මුදල් ලැබීම් හා ගෙවීම් සටහන් කරනු ලබන ගිණුම ලැබීම් හා ගෙවීම් ගිණුම වේ

- **ලක්ෂණ**

1 මුදල් පොතට සමාන ගිණුමකි

2 මෙය වත්කම් ගිණුමකි

| | | |
|---|---|---|
| | මුදල් ලැබීම් | හර |
| | මුදල් ගෙවීම් | බැර |

3 කාලපරිච්චේදය තුළ මුදල් ලැබීම් හා ගෙවීම් වල වෙනස කාලපරිච්ාච්දය අවසාන මුදල් ශේෂය වේ

4 මෙහි සාරංශය මූල්‍ය පුකාශන කට්ටලය සමග ඉදිරිපත් කරන බැවින් මෙම ගිණුම ද මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ අංගයකි

5 මුදල් පදනම අනුව සකස් කරයි

# ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙල කිරීමේ අරමුණු

- කාලච්ඡේදය අවසානයේ මුදල් ශේෂය දැනගත හැකි වීම
- මුදල් කලමනාකරණයට
- වංචා හා වැරදි අවම කර ගැනීමට
- මූල්‍ය සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා
- ඉදිරි කටයුතු සැලසුම් කිරීමට

## ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙල කිරීම

<u>මුදල් ලැබීම්</u> - මුදල් යනු වත්කමකි මුදල් ලැබීම නිසා වත්කම් වැඩි වන බැවින් සෑම මුදල් ලැබීමක් ම මෙම ගිණුමේ **හර**ට සටහන් කරයි

<u>මුදල් ගෙවීම්</u> - මුදල් යනු වත්කමකි මුදල් ගෙවීම නිසා වත්කම් අඩු වන බැවින් සෑම මුදල් ගෙවීමක් ම මෙම ගිණුමේ **බැර**ට සටහන් කරයි

# ලැබීම් හා ගෙවීම් ගිණුම

...................... ව්‍යාපාරය
0000/00/00 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලැබීම් හා ගෙවීම් ගිණුම

තීරු තුනකට ලියා දක්වන්න

හර | බැර

| | | | |
|---|---|---|---|
| ආරම්භක ශේෂය | xxxx | මුදල් ගෙවීම් | xxxx (B) |
| මුදල් ලැබීම් | xxx | | |
| | | | A-B |
| | | ශේෂය ප/ගෙ | xxx |
| | (A) xxxxx | | xxxxx (A) |
| ශේෂය ඉ/ගෙ | | | |
| | xxxx | | |

මුදල් ලැබීම් හර පැත්තෙත් මුදල් ගෙවීම් බැර පැත්තෙත් සටහන් කර වටිනාකමින් වැඩි පැත්තේ එකතුව ගෙන ගිණුම තුලනය කරන්න

- **ක්‍රියාකාරකම 01**
- දිලෙන තරු ක්‍රීඩා සමාජයේ 2020 ජූලි මාසයට අදාල ලැබීම් හා ගෙවීම් පිළිබද තොරතුරු පහත දැක්වේ

ආරම්භක ශේෂය - 20000 → ලැබීම් හා ගෙවීම් ගිණුම වත්කම් ගිණුමක් බැවින් හරට සටහන් කරන්න

සාමාජික මුදල් ලැබීම් 30000 → මුදල් ලැබීමක් නිසා වත්කම් වැඩිවීම හර

ගොඩනැගිලි කුලී ගෙවීම් 5000 → මුදල් ගෙවීමක් නිසා වත්කම් අඩුවීම බැර

පරිත්‍යාග ලැබීම් 10000 → මුදල් ලැබීමක් නිසා වත්කම් වැඩිවීම හර

දුරකතන ගාස්තු 2000 → මුදල් ගෙවීමක් නිසා වත්කම් අඩුවීම බැර

පොලී ආදායම් 3000 → මුදල් ලැබීමක් නිසා වත්කම් වැඩිවීම හර

ලිපි ද්‍රව්‍ය 5000 → මුදල් ගෙවීමක් නිසා වත්කම් අඩුවීම බැර

1 ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙල කරන්න

# පිළිතුර

.දිලෙන තරු ක්‍රීඩා සමාජය
2020 ජූලි මාසය සඳහා
ලැබීම් හා ගෙවීම් ගිණුම

හර | බැර

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 20000 | ගොඩනැගිලි කුලී | 5000 |
| සාමාජික මුදල් ලැබීම් | 30000 | දුරකතන | 2000 |
| පරිත්‍යාග | 10000 | ලිපි ද්‍රව්‍ය | 5000 |
| පොලී ආදායම් | 3000 | | |
| | | ශේෂය ප/ගෙ | 51000 |
| | 63000 | | 63000 |
| ශේෂය ඉ/ගෙ | 51000 | | |

12000

63000-12000

# ක්‍රියාකාරකම 02

- රන්තරු ක්‍රීඩා සමාජයේ 2020/12/31 න් අවසන් වර්ෂය සදහා මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් පහත දැක්වේ (රු)

| | |
|---|---|
| ආරම්භක ශේෂය | 50000 |
| සාමාජික මුදල් ලැබීම් | 75000 |
| ක්‍රීඩා උපකරණ මිලට ගැනීම | 60000 |
| ක්‍රීඩා පිටිය නඩත්තුව | 15000 |
| විදුලිය | 8000 |
| දුරකථන වියදම | 5000 |
| පරිත්‍යාග ලැබීම් | 25000 |
| කුලී ගෙවීම් | 17000 |
| සගරා විකිණීමේ ආදායම | 12000 |

1. රන්තරු ක්‍රීඩා සමාජයේ 2020/12/31 න් අවසන් වර්ෂය සදහා ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙල කරන්න

# පිළිතුර

**.රන් තරු ක්‍රීඩා සමාජය**

**2020 /12/31 න් අවසන් වර්ෂය සඳහා**

**ලැබීම් හා ගෙවීම් ගිණුම**

හර (රු)බැර

| | | | | |
|---|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 50000 | ක්‍රීඩා උපකරණ | 60000 | |
| සාමාජික මුදල් ලැබීම් | 75000 | ක්‍රීඩා පිටිය නඩත්තුව | 15000 | 105000 |
| පරිත්‍යාග | 25000 | විදුලිය | 8000 | |
| සගරා විකිණීමේ ආදායම් | 12000 | දුරකතන | 5000 | |
| | | කුලී | 17000 | |
| | | | | 162000-105000 |
| | | ශේෂය ප/ගෙ | 57000 | |
| | 162000 | | 162000 | |
| ශේෂය ඉ/ගෙ | 57000 | | | |

# ක්‍රියාකාරකම 03

- ශක්ති යොවුන් සමාජයේ පහත දැක්වෙන මුදල් ලැබීම් හා ගෙවීම් ජනවාරි මාසය තුළ දී සිදු වී ඇත

ජනවාරි මස ආරම්භක දිනට යොවුන් සමාජයේ මුදල් ශේෂය රු 5000 ක් විය

| | |
|---|---|
| පරිත්‍යාග ලැබීම් | 35000 |
| ප්‍රවාහන වියදම | 2000 |
| මුද්‍රණ වියදම | 10000 |
| කම්කරු කුලී | 5000 |
| ටිකට්පත් විකිණීම | 20000 |
| සංග්‍රහ වියදම | 5000 |
| උපකරණ මිලට ගැනීම | 15000 |
| විදුලි ගාස්තුව | 2000 |

- අමතර තොරතුරු

- 1) යොවුන් සමාජයේ සමාජික සංඛ්‍යාව 100 කි ඉන් 20 දෙනෙකු සමාජික මුදල් ගෙවා නැත

    මාසික සාමාජික ගාස්තුව රු 200 කි

2) උපකරණ 10% කින් වාර්ෂික ක්ෂය කරයි

3) ටිකට්පත් විකිණීමෙන් රු 5000 ලැබිය යුතුය

4) ජනවාරි මස දුරකථන වියදම මෙතෙක් ගෙවා නැත

- ***අධ්‍යනයට***

- *ලැබීම් හා ගෙවීම් ගිණුම වත්කම් ගිණුමක් බැවින් හරට සටහන් කරන්න*

- *ඉන් පසු අමතර තොරතුරුවලින් ගණන සැදීම ආරම්භ කරන්න*

  *1) සාමාජික මුදල් ලැබීම් ගණනය කරන්න*

| | | |
|---|---|---|
| | *සාමාජික සංඛ්‍යාව* | *100* |
| *(-)* | *මුදල් නොගෙවූ සාමාජික සංඛ්‍යාව* | *(20)* |
| | *මුදල් නොගෙවූ සාමාජික සංඛ්‍යාව* | *80* |

- ***ලැබුණු සාමාජික මුදල් = (මුදල් ගෙවූ සාමාජික සංඛ්‍යාව x මාසික සාමාජික ගාස්තුව***

  ***= 80 x 200***

  ***16000***

- *ක්ෂය වීම් හා ලැබිය යුතු හා ගෙවිය යුතු වියදම් නිසා ව්‍යාපාරයට මුදල් ගලා ඒමක් හෝ මුදල් ගලා යාමක් සිදු නොවන බැවින් එම ගණදෙනු ලැබීම් හා ගෙවීම් ගිණුමේ සටහන් කරන්නේ නැත*

# පිළිතුර

.ශක්ති යොවුන් සමාජය
2020 ජනවාරි මාසය සඳහා
ලැබීම් හා ගෙවීම් ගිණුම

හර | බැර

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 5000 | ප්‍රවාහන | 2000 |
| සාමාජික මුදල් ලැබීම් | 16000 | මුද්‍රණ | 10000 |
| පරිත්‍යාග | 35000 | කම්කරු කුලී | 5000 |
| ටිකට්පත් විකිණීම | 20000 | සංග්‍රහ | 5000 |
| | | උපකරණ ගැණුම් | 15000 |
| | | වීදුලිය | 2000 |
| | | ශේෂය ප/ගෙ | 37000 |
| | 76000 | | 76000 |
| ශේෂය ඉ/ගෙ | 37000 | | |

39000

76000-39000

# සාමාජික මුදල්

- ලාභ නොලබන ව්‍යාපාරයක ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ සාමාජික මුදල්ය සාමාජික මුදල් මාසිකව ත්‍රෛයි මාසිකව අර්ධ වාර්ෂික හෝ වාර්ෂිකව අය කර ගනී
- යාව ජීව සාමාජිකත්වය - ඇතැම් සාමාජිකයන් තම ජීවිත කාලය සඳහාම එකවරම සාමාජික මුදල් ගෙවීමෙන් ලබන සාමාජිකත්වය වේ

- **සාමාජික මුදල් ආශ්‍රිත ගණනය කිරීම**

- **වාර්ෂික සාමාජික මුදල = සාමාජිකයන් ගණන x වාර්ෂික සාමාජික මුදල**

- **ලැබුණු සාමාජික මුදල් = සාමාජික මුදල් ගෙවූ සාමාජික සංඛ්‍යාව x වාර්ෂික සාමාජික මුදල**

- **නොලැබුණු සාමාජික මුදල් = සාමාජික මුදල් නොගෙවූ සාමාජික සංඛ්‍යාව x වාර්ෂික සාමාජික මුදල්**

# උදාහරණ

- සිංහ ක්‍රීඩා සමාජයේ වාර්ෂික සාමාජික මුදල රු 100 වන අතර සාමාජික සංඛ්‍යාව 300 කි ඉන් 25 දෙනෙකු අදාල වසරේ සාමාජික මුදල් ගෙවා නැත

- **වාර්ෂික සාමාජික මුදල = සාමාජිකයන් ගණන x වාර්ෂික සාමාජික මුදල**

  **300 x 100**

  **<u>රු 30000</u>**

**හෝ**

- **ලැබුණු සාමාජික මුදල් = සාමාජික මුදල් ගෙවූ සාමාජික සංඛ්‍යාව x වාර්ෂික සාමාජික මුදල**

  **(300-25) x 100**

  **<u>රු 27500</u>**

- **නොලැබුණු සාමාජික මුදල් = සාමාජික මුදල් නොගෙවූ සාමාජික සංඛ්‍යාව x වාර්ෂික සාමාජික මුදල්**

  **25 x 100**

  **<u>2500</u>**

**වාර්ෂික සාමාජික මුදල - ලැබුණු සාමාජික මුදල් + නොලැබුණු සාමාජික මුදල්**

27500 **+** 2500

**<u>30000</u>**

# උපචිත පදනම / මුදල් පදනම

- **උපචිත පදනම්** උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී මුදලින් ලැබුණාද නොලැබුණා ද මුදලින් ගෙව්වද නොගෙව්වද කාලච්ඡේදයට අයත් සියලුම ආදායම් හා වියදම් සටහන් කරයි

- උදාහරණ
- වාර්ෂික මුදලින් ගෙවූ විදුලිය වියදම රු 12000 ක් වන අතර වර්ෂයට ආදාලව රු 2000 ක් ගෙවිය යුතුව ඇත

| | |
|---|---|
| වාර්ෂික මුදලින් ගෙවූ විදුලිය වියදම | රු 12000 |
| අතර වර්ෂයට ආදාලව ගෙවිය යුතු විදුලිය වියදම | රු 2000 |
| **වර්ෂයේ විදුලිය වියදම** | **රු 14000** |

**මුදල් පදනම** උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී මුදලින් ලැබුණා හා මුදලින් ගෙවූ කාලච්ඡේදයට අයත් ආදායම් වියදම් පමණක් සටහන් කරයි

ඉහත උදාහරණයට අනුව මුදලින් ගෙවූ වියදම වන රු 12000

# ආදායම් ප්‍රකාශය

- ලාභ අරමුණු කර නොගත් සංවිධාන විසින් කිසියම් නිශ්චිත කාලච්ඡේදයක් තුළ සිදුකරන ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා පිළියෙල කරන ප්‍රකාශය යි

- ලක්ෂණ
  - ❖ ලාභ හෝ අලාභ ප්‍රකාශනයට බොහෝ දුරට සමානය
  - ❖ කාලච්ඡේදයට අදාල ආදායම් හෝ වියදම් සටහන් කරයි
  - ❖ කාලච්ඡේදය අවසානයේ අතිරික්තය හා ඌණතාවය ගණනය කරයි
  - ❖ උපචිත පදනමට ගණනය කරයි

- ප්‍රග්ධන වියදම් ආදායම් ප්‍රාශයට ඇතුලත් නොකරයි. ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරන්නේ පුනරාවර්තන වියදම් පමණි.

# ලැබීම් හා ගෙවීම් ගිණුම හා ආදායම් වියදම් ප්‍රකාශය අතර වෙනස්කම්

| ලැබීම් හා ගෙවීම් ගිණුම | ආදායම් වියදම් ප්‍රකාශය |
|---|---|
| මුදල් පොතට සමාන ගිණුමකි | ලාභ හෝ අලාභ ප්‍රකාශනයට බොහෝ දුරට සමානය |
| කාලපරිච්චේදය අදාළ මුදල් ලැබීම් හා ගෙවීම් සටහන් කරයි | කාලච්ඡේදයට අදාල ආදායම් හෝ වියදම් සටහන් කරයි |
| කාලපරිච්ාච්දය අවසාන අත ඉතිරි මුදල් ශේෂය පෙන්නුම් කරයි | කාලච්චේදය අවසානයේ අතිරික්තය හා ඌණතාවය ගණනය කරයි |
| මුදල් පදනමට පිළියෙල කරයි | උපචිත පදනමට පිළියෙල කරයි |

# ආදායම් ප්‍රකාශන ආකෘතිය

................... සමාජය
0000/00/00 න් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශනය

තීරු තුනකට ලියා දක්වන්න

| | | රු |
|---|---|---|
| **ආදායම්** | | |
| සාමාජික ගාස්තු | XXXX | |
| කොඩි විකිණීම | XXXX | |
| පරිත්‍යාග | XXX | |
| සංදර්ශන / උත්සව පැවැත්වීම | XX | |
| ආපනශාලා පවත්වාගෙන යාම | XXX | |
| තරග සංවිධානය | XXX | |
| | | XXXXX |
| **වියදම්** | | |
| විදුලිය / ජලය | XXX | |
| දුරකථන බිල් | X | |
| පරිත්‍යාග | XX | |
| සංදර්ශන වියදම් | XXX | |
| වැටුප් | XXX | (XXX) |
| **අතිරික්තය / ඌණතාවය** | | **XXXX** |

ආදායම්වල එකතුව මෙම තීරුවට රැගෙන යන්න

ආදායම්වල එකතුව මෙම තීරුවට රැගෙන යන්න

# ක්‍රියාකාරකම 01

- දිරිය යොවුන් සාමාජයේ 2020/12/31 න් අවසන් වර්ෂය සදහා ආදායම් වියදම් පහත පරිදි වේ

- සාමාජික මුදල් ලැබීම 50000
- දුරකථන වියදම් 2000
- සංග්‍රහ වියදම් 5000
- පත්තර විකිණීම 10000
- ගොඩනැගිලි කුලි 7000
- පරිත්‍යාග ලැබීම් 15000
- සගරා විකිණීම 12000
- මුද්‍රණ ගාස්තු 17000

- 2020/12/31 න් අවසන් වර්ෂය සදහා ආදායම් වියදම් ගිණුම පිළියෙල කරන්න

# ආදායම් ප්‍රකාශන ආකෘතිය

**දිරිය යොවුන් සමාජය**
**2020/12/31 න් අවසන් වර්ෂය සඳහා**
**ආදායම් ප්‍රකාශනය**

තීරු තුනකට ලියා දක්වන්න

| | | රු |
|---|---|---|
| **ආදායම්** | | |
| සාමාජික ගාස්තු | 50000 | |
| පත්තර විකිණීම | 10000 | |
| පරිත්‍යාග | 15000 | |
| සඟරා විකිණීම | ï2000 | |
| **වියදම්** | | 87000 |
| දුරකථන බිල් | 2000 | |
| සංග්‍රහ වියදම් | 5000 | |
| ගොඩනැගිලි කුලි | 7000 | |
| මුද්‍රණ ගාස්තු | 17000 | |
| | | (31000) |
| **අතිරික්තය / ඌනතාවය** | | **56000** |

# ක්‍රියාකාරකම 03

- දේදුනු යොවුන් සමාජයේ පහත දැක්වෙන මුදල් ලැබීම් හා ගෙවීම් 2020 වර්ෂය තුළ දී සිදු වී ඇත

| | |
|---|---|
| පරිත්‍යාග ලැබීම් | 45000 |
| ප්‍රවාහන වියදම | 5000 |
| මුද්‍රණ වියදම | 15000 |
| කම්කරු කුලී | 5000 |
| ටිකට්පත් විකිණීම | 15000 + 5000 |
| සංග්‍රහ වියදම | 1000 |
| උපකරණ මිලට ගැනීම | 60000 |
| විදුලි ගාස්තුව | 5000 - 1000 |
| ඉඩම් | 120000 |
| දුරකථන | 2500 + 500 |

- අමතර තොරතුරු

- 1) යොවුන් සමාජයේ සමාජික සංඛ්‍යාව 200 කි ඉන් 30 දෙනෙකු සමාජික මුදල් ගෙවා නැත
 මාසික සාමාජික ගාස්තුව රු 200 කි

 2) විදුලිය ගාස්තු වැඩිපුර රු 1000 ගෙවා ඇත

 3) උපකරණ 10% කින් වාර්ෂික ක්ෂය කරයි

 3) ටිකට්පත් විකිණීමෙන් රු 5000 ලැබිය යුතුය

 4) දෙසැම්බර් මස දුරකථන වියදම රු 500 මෙතෙක් ගෙවා නැත

 - 2020 වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම පිළියෙල කරන්න

# ආදායම් ප්‍රකාශන ආකෘතිය

**දිරිය යොවුන් සමාජය**
**2020/12/31 න් අවසන් වර්ෂය සඳහා**
**ආදායම් ප්‍රකාශනය**

තීරු තුනකට ලියා දක්වන්න

| | | රු |
|---|---|---|
| **ආදායම්** | | |
| සාමාජික ගාස්තු | 40000 | |
| ටිකට්පත් විකිණීම | 20000 | |
| පරිත්‍යාග | 45000 | |
| | | 105000 |
| **වියදම්** | | |
| විදුලිය | 4000 | |
| උපකරණ ක්ෂය | 6000 | |
| දුරකථන බිල් | 3000 | |
| ප්‍රවාහන | 5000 | |
| මුද්‍රණ ගාස්තු | 15000 | |
| කම්කරු කුලි | 5000 | |
| සංග්‍රහ වියදම් | 1000 | (39000) |
| අතිරික්තය / ඌණතාවය | | **66000** |

අධ්‍යනයට

- ගණන සැදීම ආරම්භ කළ යුත්තේ අමතර තොරතුරු වලිනි

1) ) *සාමාජික ගණනය කරන්න*

***සාමාජික මුදල් - (සාමාජික සංඛ්‍යාව x මාසික සාමාජික ගාස්තුව***

***= 200 x 200***

***40000***

**(**මුදලින් ලැබුණ ද නොලබුණ ද ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරයි)

2)වාර්ෂික විදුලි ගාස්තුව **=** වර්ෂයට අදාල විදුලි ගාස්තුව ගෙව්වද නොගෙව්වද සටහන් කරන්න

**=** මුදලින් ගෙවූ විදුලිය - වැඩිපුර ගෙවූ විදුලිය

4000 **=** 5000 - 1000

3) උපකරණ ක්ෂය **=** ***පිරිවැය x ක්ෂය අනුපාතය***

6000 = 60000 *x* $\frac{10}{100}$

( උපකරණ මිලට ගැණුම් ප්‍රාග්ධන වියදමක් බැවින් ආදායම් ප්‍රකාශයට ඇතුලත් නොකරයි ’ෂය පුනරාවර්තන වියදමක් බැවින් ආදයම් ප්‍රකාශයට ඇතුලත් කරයි)

4)වර්ෂයට අදාල ආදායම සටහන් කරන්න

ටිකට්පත් විකිණීම + ලැබිය යුතු ටිකට්පත් විකිණීම ආදායම

15000 + 5000

20000

5) දුරකථන වියදම් = මුදලින් ගෙවූ දුරකථන වියදම් + ගෙවිය යුත දුරකථන වියදම

3000 = 2500 + 500

- අමතර තොරතුරු විසඳීමෙන් අනතුරුව අනෙක් ඉතිරි තොරතුරු ආදාවම් ප්‍රකාශයේ සටහන් කරන්න
- ඉඩම් ගැනීම ප්‍රාග්ධන වියදමක් බැවින් ආදායම් ප්‍රකාශයට ඇතුලත් නොකරයි

11 ශ්‍රේණිය පෙළ පොතේ පිටු අංක 105 හා 106 හි ඇති අභ්‍යාස කරන්න